**තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකල යුතු වුවත්, 2018 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් හර ශේෂ 39 ක එකතුව වූ රු. 4,102,112 කින් අත්තිකාරම් බැර ශේෂ 23 ක එකතුව වූ රු. 1,024,520 ක් හිලව් කර මූල්‍ය ප්‍රකාශන වල ජංගම වත්කම් යටතේ අත්තිකාරම් ලෙස රු.3,077,593 ක් දක්වා තිබුණි. | මෙය ගිණුම් දත්ත සැකසීමේදී දත්ත ඇතුළත් කිරීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයකි. එය වාර්ෂික වාර්තාවේ නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 30 (ආ) හා (ඇ) ඡේද පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී මුදල් නොවන අයිතමයන් යටතේ දැක්විය යුතු සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂිත වෙන් කිරීම් රු. 4,042,534 කින් මුදල් ගලායාමක් ලෙස දැක්විය යුතු වර්ෂය තුල මුදලින් ගෙවන ලද පාරිතෝෂිත ගෙවීම් රු. 995,698 ක් හිලව්කර මූල්‍ය නොවන අයිතම යටතේ පාරිතෝෂිත වෙන්කිරීම් ලෙස රු. 3,046,836 ක් දක්වා තිබුණි. | මෙහිදී පාරිතෝෂිත අගය ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත්තේ පෙර වර්ෂයේ අවසාන ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂය අතර වෙනසයි . මුදලින් ගෙවූ අගය සහ අදාළ වර්ෂයේ වෙන්කිරීම වෙන් වෙන් ව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. | විගණනය කර සහතික කල මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවට ඇතුලත් කල යුතු අතර එහිදී සංශෝධනයන් සිදුකල නොහැකිය. ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වර්ෂයට අදාල විලම්භිත ආදායම රු. 8,958,303 ක් වුවද මූල්‍ය නොවන අයිතම යටතේ එම ආදායම රු.5,271,703 ක් ලෙස දක්වා තිබුණි. | මෙහිදී මුදල් ප්‍රවාහ ප්‍රකාශයට විලම්භිත ආදායමෙ අගය ලෙස පෙන්වා ඇත්තේ පෙර වර්ෂයේ අවසාන ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂය අතර වෙනසයි. එයද වාර්ෂික වාර්තාවේ වෙන් වෙන්ව දැක්වීමට පියවර ගෙන ඇත. | |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 පරිදි සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් ලැබුණු රු. 1,943,990 ක් හා නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියෙන් ලැබුණු රු. 1,578,074 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලා එමක් ලෙස දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ දි භාණ්ඩාගාරයේ ප්‍රදානයන් යොදා ගනිමින් මිලදී ගන්නා ලද රු. 1,943,990 ක් වූ වත්කම්වල අගය සහ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කරමින් මිලදී ගන්නා ලද රු. 1,578,074 ක් වූ වත්කම්වල අගය මුදල් යෙදවීමක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ඇතිවූ ප්‍රවාහයන් යන ශීර්ෂය යටතේ දක්වා ඇත. | නිරීක්ෂණයට අදාලව පිළිතුරු ලබා දී නොමැත. ඉදිරි වර්ෂවලට අදාල ගිණුම් පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කල යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ වල සාධාරණ වටිනාකම වෙනස්වීම් මත ප්‍රත්‍යාගණනයක් සිදු කල යුතු අතර සාධාරණ වටිනාකම් සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් ඇතිවිට සෑම වර්ෂ තුනකටම හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනයක් සිදුකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු ශුද්ධ අගය රු. 29,296,226 ක් වූ වත්කම් සම්බන්ධයෙන් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය සිදුකර නොතිබුණි. | දේපළ හා පිරියත ප්‍රත්‍යාගණනයක් කිරීමට පියවර ගෙන ඇත. | අදාල ගිණුම්කරණ ප්‍රමිතය පරිදි වත්කම් ප්‍රත්‍යාගණනය කල යුතුය. |
| (ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.100,694,617 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් එම වත්කම් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ක්ෂය කිරීම හීන වන ශේෂ පදනම මත ගණනය කරන බැවින් වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වී නොමැති බව සඳහන් කරමි . ප්‍රමිතයේ 07 හි 65 වන ඡේදයට අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳ සමාලෝචනයක් කර ප්‍රතිශෝධනයක් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | අදාල ගිණුම්කරණ ප්‍රමිතය පරිදි ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 61 ඡේදය ප්‍රකාරව පාරිතෝෂිත වෙන් කිරීම් ගණනය කිරීමේදී ආයුගණක තක්සේරු ශිල්පක්‍රම භාවිතා කරමින් විශ්වාසදායී ඇස්තමේන්තුවක් සිදු කල යුතු වුවත්, කොමිෂන් සභාව විසින් නිලධාරියා අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන රු. 16,754,188 ක පාරිතෝෂිත වෙන් කිරීම් සිදුකර තිබුණි. | පාරිතෝෂිත වෙන් කිරීම මෙතෙක් ගණනය කර ඇත්තේ සේවකයෙක් වර්ෂයේ අවසාන මාසයට උපයාගෙන ඇති වැටුපෙන් අඩක් ගෙන එය සේවා කාලයෙන් වැඩිකිරීමෙනි. ඒ අනුව විගණනයෙන් සඳහන් කළ ඇති පරිදි ආයුගණන තක්සේරු ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂිත වෙන්කිරීම ගණනය කිරීමට උපදෙස් දී ඇත. | ඉදිරි වර්ෂයට අදාලව පාරිතෝෂිත වෙන් කිරීම් සිදුකිරීමේදී ප්‍රමිතය ප්‍රකාරව ආයුගණක තක්සේරු ශිල්පක්‍රම අනුගමනය කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි 09 ඡේදය පරිදි මුදල් හා මුදල් සමාන දෑ සඳහා මුදල්, බැංකු ශේෂ හා මාස 03 කට අඩු කල්පිරීමේ කාලයක් සහිත ආයෝජන ඇතුලත් කල යුතු වුවත් ආයතනය විසින් හඳුනාගෙන තිබුණු ප්‍රතිපත්තිය අනුව බැංකුවේ මුදල් පමණක් ඇතුලත් බව දන්වා තිබුණි. | ගිණුම් ප්‍රතිපත්ති තුල මුදල් හා මුදල් සමාන දෑ යටතේ බැංකු මුදල් පමණක් සඳහන් කර ඇති බව පිළිගනිමි. මේ අනුව ඉදිරි වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනයේ සටහන් යටතේ දක්වා ඇති පරිදි අයෝජනයද ඇතුලත් කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ ගිණුම් ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කල යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්‍ෂණ කරුනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂවලට අදාලව ගෙවන ලද එකතුව රු. 1,959,974 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ වියදම ලෙස ගිණුම්ගතව තිබූ පෙර වර්ෂවලට අදාළ වියදම් පෙර වර්ෂ ගැලපුම් ගිණුම මඟින් ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇත. | වර්ෂයට අදාල ආදායම් හා වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු රු. 940,628 ක මුදල ඉකුත් වර්ෂයේ උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබිය දී සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා ගෙවන ලද මුදල, උපචිත වියදම් ගිණුමට ගලපා තිබුණි. | 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල අර්ථසාධක අරමුදල වන රු. 820,530 ක මුදල පෙර වර්ෂ ගිණුම තුලින් ගලපා 2018 අදාල අර්ථසාධක අරමුදල් අගය වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමේදී නිවැරදි කරන ලෙස උපදෙස් දී ඇත. | වාර්ෂික වාර්තාවට ඇතුලත් කල යුත්තේ විගණනය කර සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන වේ. බැංකුව විසින් සිදු කරනු ලබන සෘජු හර කිරීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මාස තුනකට අදාලව බැංකු ගිණුමක් හරහා ගෙවීම් කර තිබුණු රු.1,683,048 ක සේවක අර්ථසාධක අරමුදල්, ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මුදල් ශේෂය හා ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. | සේවක අර්ථ සාධක අරමුදලට සෘජු බැර කිරීම් කර තිබූ රු. 1,683,048 ක් වූ 2018 වර්ෂයේ ජුනි , ඔක්තෝම්බර් සහ දෙසැම්බර් මාස තුනට අදාලව ද්විත්ව සටහන් යෙදීමට පියවර ගනිමි .වාර්ෂික වාර්තාවේ එය හෙලිදරව් කරන ලෙස උපදෙස් දී ඇත. | |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසාන තොගය ලෙස හඳුනාගත යුතු රු. 3,456,740 ක් වටිනා පොත් හා සහතික පත්‍ර, වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයට අදාල අතිරික්තය හා අවසන් තොගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට ශිෂ්‍ය වාර්ථා පොත් නොතිබුණු අතර ඉතිරිව තිබූ ලිපි ද්‍රව්‍ය හා සහතිකපත් වල පිරිවැය පමණක් අවසන් තොගය ලෙස ගිණුම් ගත කරන ලදී . මේ අනුව විගණනයෙන් පෙන්වා දි ඇති පරිදි වෙනත් මුද්‍රිත පොත්වල අගය ගණනයකොට එහි අගය වාර්ෂික වාර්තාවේ හෙලිදරව් කරන ලෙස උපදෙස් දී ඇත. | වාර්ෂික වාර්තාවට ඇතුලත් කල යුත්තේ විගණනය කර සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන වන අතර නිවැරදි ලෙජර් ගිණුම්වල වියදම් ගැලපීමට කටයුතු කල යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 1,696,187 ක් වූ වියදම් ඉකුත් වර්ෂයට අදාල වියදම් ලෙස සලකා ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයෙන් සඳහන් කර ඇති පරිදි එකතුව රු. 1,696,187 ක් වූ පෙර වර්ෂයට අදාළ වියදම් ලෙස ගිණුම්ගත වී තිබූ අගය පරීක්ෂාකර බලා නිවැරදි කරන ලෙස උපදෙස් දී ඇත. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කලයුතුය. |

**1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| අපදා ණය | 7,357,304 | 6,977,460 | 379,844 | ආපදාණය ලේඛනය සම්පූර්ණයෙන් පරීක්ෂාකර බලා මෙම වෙනස පිළිබඳව තවදුරටත් අධ්‍යනය කොට එය වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර නිවැරදි කරන ලෙස උපදෙස් දී ඇත. | වාර්ෂික වාර්තාවට ඇතුලත් කල යුත්තේ විගණනය කර සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන වේ. මූල්‍ය ප්‍රකාශනවල ශේෂ ඇතුලත් කිරීමේදී උපයෝගි ලේඛන සමඟ සසදා නිවැරදි ශේෂ ඇතුලත් කිරීමට පියවර ගත යුතුය. |

**1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් ශේෂය | 1,879,170 | විස්තරාත්මක උපලේඛන | අත්තිකාරම් ශේෂය තුල පවත්නා රු. .1,879,170 ක් වූ ශේෂය පිළිබඳ විස්තරාත්මක ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇත. | විගණනයට අවශ්‍ය වන විස්තරාත්මක උපලේඛන සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණු රු. 24,099,614 ක ශේෂය තුල වර්ෂ 2 ත් වර්ෂ 11 ත් අතර කාලයක සිට අය නොවී පවතින රු. 1,020,695 ක ශේෂ පවතින බව නිරීක්ෂණය විය. | එයින් රු. 167,895 ක් අයකරගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති අතර රු.716,000 කින් ආදායම් ද්වී ගණනය වී ඇති බැවින් ඉදිරියේදී නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | අයනොවී පවතින ශේෂ අයකර ගැනීමට හා ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ආයතනයේ දැනට සේවයේ නියුතු හා සේවයෙන් ඉවත් කල නිලධාරීන් 15 දෙනෙකුගෙන් එකතුව රු. 308,613 ක් වූ විවිධණය අය නොවී පැවතුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට පියවර ගනිමි. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.11,389,396 ක ශේෂය තුල ඇතුලත් රු. 5,935,975 ක ශේෂය වර්ෂ 01 සිට වර්ෂ 08 දක්වා කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂා කර බලා ගෙවීම් කිරීමට පියවර ගතිමි. | කඩිනමින් ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(I). මුදල් රෙගුලාසි 135** | මුදල් පාලනය සම්බන්ධව බලතල පවරාදීම සිදුකර නොතිබූ නිළධාරියකු විසින් එකතුව රු. 8,903,532 ක්වූ ගෙවීම් වවුචර් 200 ක් සඳහා වියදම් සහතික කිරීම සිදුකර තිබුණි. | වසර 03ක ඇගයුම්කරුවන්ගේ ගෙවීම් ප්‍රමාද වී තිබූ බැවින් ඒවා නිරවුල් කිරීමේ කාර්යය කඩිනමින් ඉටු කිරීමේ අවශ්‍යතාවය මත ගිණුම් අංශයෙහි සහකාර අධ්‍යක්ෂවරිය විසින් වවුචර්පත් සහතික කිරීම කර තිබුණි . එම සහතික කිරීම සඳහා ක්‍රමානුකූල බලය පැවරීමේ කාර්යය 2019 වර්ෂයේ මූල්‍ය බලතල බෙදා හැරීමේදී ඉටුකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය බලතල පැවරීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| **(II).** | **මුදල් රෙගුලාසි 257** | මුදල් රෙගුලාසි විධිවිධානයන්ට පටහැනිව එකතු වටිනාකම රු. 19,182,032 ක් වූ ගෙවීම් වවුචර් 403 ක් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | මෙහිදී වියදම් සහතික කිරීම පරිගණකගත කරන ලද ගිණුම්කරණ පැකේජය මඟින් සිදු කරන බැවින් අත්සන යෙදීම මඟහැරී තිබුණද අදාළ නිළධාරියා විසින් ගිණුම්කරණ පැකේජය තුළින් වියදම අනුමත කළ පසුව පමණක් ගෙවීමට අදාළ ඉදිරිකටයුතු කළ හැකි පරිදි මූල්‍ය පාලනයක් එම පද්ධතියේ ගොඩනඟා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සහතික නොකල වවුචරයකට මුදල් ගෙවීම බල රහිත ගෙවීමක් වශයෙන් සැලකෙන බැවින් ගෙවීම් වවුචර් අදාල නිලධාරීන් විසින් සහතික කල යුතුය. |
| **(III).** | **මුදල් රෙගුලාසි 371 (2) (ආ) ඡේදය හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | i. තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම මාණ්ඩලික නිළධාරියෙකු වෙත පමණක් සිදු කල යුතු වුවත් කොමිෂන් සභාව විසින් ඊට පටහැනි ලෙස අවස්ථා 85 කදී කළමනාකරණ සහකාර නිළධාරීන් 15 දෙනෙකු වෙත එකතුව රු. 3,327,069 ක තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | කාර්යයන්හි අවශ්‍යතාවයන් මත කළමනාකරණ සහකාරවරුන්ට අත්තිකාරම් නිකුත් කර තිබුණද විගණනයෙන් පෙන්වා දුන් පරිදි මාණ්ඩලික නිළධාරීන්ට පමණක් අත්තිකාරම් ලබාදීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ii. කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිළධාරියෙකු වෙත පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කල හැකි වුවත් ඊට පටහැනිව කොමිෂන් සභාව විසින් අවස්ථා 20 කදී රු.115,000 සිට රු.378,000 ක් දක්වා පරාසය තුල තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | විගණනයෙන් ලද උපදෙස් අනුව හා 2015 සංශෝධිත මුදල් රෙගුලාසි වලට අනුව එක් අවස්ථාවකදී මාණ්ඩලික නිළධාරියෙකුට රු.100,000 දක්වා පමණක් අත්තිකාරම් නිකුත් කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(IV). මුදල් රෙගුලාසි 371 (5) හා 373** | අග්‍රිම පියවීම එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකල යුතු වුවත් 2017 හා 2018 වර්ෂයන් තුළ අවස්ථා 10 කදී ලබාදී තිබූ එකතුව රු.7,877,446 ක් වූ අග්‍රිම 2018 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණි. | නිපුණතා ආංශික සභා සීමාසහිත පෞද්ගලික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් එහි මුදල් වර්ෂය ලෙස සලකනුයේ එක් එක් අවුරුදුවල මාර්තු 31 වන දිනය. රජයේ මුදල් අනුමත කර ගෙවීම් සිදුකිරීමට පෙබරවාරි මාර්තු දක්වා කාලයක් වැය වන බැවින් නිළධාරීන්ට අවශ්‍ය වැටුප් ගෙවීමට පවා ආංශික නිපුණතා සභාවල මුදලක් නොමැති වීම වැනි ප්‍රායෝගික ගැටළු හේතුවෙන් මෙම මුදල් පියවීම ප්‍රමාද වේ. කෙසේ වෙතත් 2018 වර්ෂයේ සිට දෙසැම්බර් 31 දිනට අදාල සියළු මූල්‍ය කටයුතු ඉටු කරන ලෙස උපදෙස් දී ඇත. | යොමුගත රෙගුලාසි ප්‍රකාර අග්‍රිම පියවීම සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(V). මුදල් රෙගුලාසි 372** | අතුරු අග්‍රිම පරීක්ෂා කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, ප්‍රාදේශීය ප්‍රධානියා හෝ ඒ සඳහා බලය දෙනු ලැබූ අන්‍ය නිළධාරියෙකු විසින් මාසයකට එක් වරකට නොඅඩු වන සේ පරීක්‍ෂණය කල යුතුය. එසේ වුවද නිපුණතා ආංශික සභා වෙත ලබාදී තිබූ අත්තිකාරම් සම්බන්ධයෙන් කිසිදු පරීක්‍ෂණයක් සිදුකර නොතිබුණි. | මාසිකව පවත්වන ලද ආංශික සභා සභාපතිවරුන්ගේ සාකච්ඡාව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර එහිදී මාසිකව ඉටු කරන ලද කාර්යයන් සහ ඉදිරි කටයුතු ගැන සාකච්ඡා කර අවශ්‍ය මග පෙන්වීම් ඉටු කර ඇත. | යොමුගත රෙගුලාසි පරිදි ආංශික සභාවෙත ලබාදී ඇති අතුරු අග්‍රිම පරීක්ෂා කල යුතුය. |
| **(VI). මුදල් රෙගුලාසි 395 (ආ) හා (ඇ) ඡේද** | කොමිෂන් සභාවේ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමකට අදාලව 2018 ජනවාරි සිට 2019 ජුලි දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | 2017 වසර ගිණුම්කරණ පැකේජය අක්‍රියවීමත් සමඟම සියළු මූල්‍යමය දත්ත නැවත නව පැකේජයට ඇතුළත් කිරීමේදී ඇති වූ ප්‍රමාදය මේ සඳහා බලපා ඇති අතර 2019 සැප්තැම්බර් මාසය තුළදී 2018 වසරට අදාළ බැංකු සැසඳුම් කිරීමට කටයුතු කරන අතර 2019 වසරේ බැංකු සැසඳුම් ඉදිරි මාස 02 තුළදී නිම කිරීමට පියවර ගනිමි. | යොමුගත රෙගුලාසි ප්‍රකාරව නියමිත පරිදි බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කලයුතුය. |
| **(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 (vii) ඡේදය** | විශේෂිත අවස්ථාවකදී වැඩ බැලීමේ පත්වීම් සිදු කළද එය මාස 03 ක් ඉක්මවා ලබා නොදිය යුතු වුවත් ඊට පටහැනි ලෙස මාස 05 සිට මාස 28 දක්වා කාලයක් තුල ඉහල කළමනාකරණයට අයත් තනතුරු 11 ක් සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි. | අධ්‍යක්‍ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා 2019 දී ස්ථිර තනතුරු ලබාදී ඇත. | යොමුගත චක්‍රලේඛය පරිදි වැඩබැලීමේ පත්වීම් සිදුකල යුතුය. |
| **(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2.1 ඡේදය** | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලබන අතර එහි පවතින අඩුපාඩු නිවැරදි කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් දී ඇත. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) **2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය** | සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කල යුතු වුවත් 2018 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019 අගෝස්තු 09 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය 2019 සැප්තැම්බර් මස 07 වන දින පවත්වා ලේඛන නිවැරදිව සකස්කර විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇත. | යොමුගත රෙගුලාසි ප්‍රකාරව නියමිත දින භාණ්ඩ සමීක්ෂණය සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. |

## 1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය අංශයේ ගිණුම් කටයුතු සඳහා භාවිතා කල තිබස් පරිගනකගත ගිණුම්කරණ පැකේජය 2017 මැයි 09 දින සිට ක්‍රියාවිරහිත වීම හේතුවෙන් පද්ධතියට ඇතුලත් කර තිබූ සියළු දත්ත විනාශවී තිබුණි. තවද පරිගණකයෙන් පිටත දත්ත ගබඩා කර තබා ගැනීමේ පිළිගත් ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කර නොතිබූ බැවින් දත්ත නැවත ලබා ගැනීමටද නොහැකි වී තිබූ අතර 2019 පෙබරවාරි 08 දිනැති අංක VTY/E/TVEC/1/17/19 දරන අවසාන විගණකාධිපති වාර්තාව මගින්ද කරුණු අනාවරණය කර තිබූ නමුත් මේ සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් 2019 ජූලි 31 දින දක්වා සිදුකර නොතිබුණි. | අධ්‍යක්ෂ ජනරාල් විසින් විමර්ශනයක් පැවැත්වීමට අවශ්‍ය කමිටුවක් පත් කරමින් මෙහි දක්වා ඇති පරිදි ක්‍රියා කිරීමට මේ වන විට සැලසුම්කර ඇත. | කඩිනමින් පරීක්ෂණයක් සිදුකර වගකිවයුතු නිලධාරීන් හඳුනාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 29,585,644 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 16,912,796 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 12,672,848 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වසරේ මෙහෙයුම් ආදායම් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමස්ථ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 16 කින් වර්ධනය වී තිබුණු අතර සමස්ථ වියදම සියයට 11.25 කින් වර්ධනය වී තිබුණි. සමස්ථ ආදායම වර්ධනයවීම සඳහා සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර පුනරාවනර්තන ප්‍රදාන සියයට 07 කින් හා මෙහෙයුම් ආදායම් සියයට 132 කින් වර්ධනයවීම බලපා තිබුණු අතර පෞද්ගලික පඩිනඩි හා මෙහෙයුම් වියදම් සියයට 19 කින් වැඩිවීම හා ගමන් වියදම් සියයට 66 කින් අඩුවීම, සමස්ථ වියදම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2017 වර්ෂයේදී 3.8 ව පැවති ජංගම වත්කම් අනුපාතය 2018 වර්ෂය වන විට 5.74 ක් දක්වා වර්ධනය වී තිබුණි. එනම් පෙර වර්ෂයට සාපේක්ෂ ජංගම වගකීම් පියවීම සඳහා පවතින ජංගම වත්කම් ප්‍රමාණය 1.94 කින් වර්ධනය වී තිබුණි.

තවද ක්ෂණික වත්කම් අනුපාතය සැලකිමේදී 2017 වර්ෂයේ 3.58 ව පැවති අනුපාතය 2018 වර්ෂය වන විට 5.48 දක්වා වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අලෙවි කිරීම සඳහා පුස්තකාලය වෙත ලැබී තිබුණු වර්ග 13කට අදාල වටිනාකම රු.2,119,675 ක්වූ පොත් 6769 ක් සභාපතිවරයාගේ වාචික උපදෙස් මත නිකුත් කරන බව තොග පොතෙහි සටහන් කරමින් මුදල් ලබා ගැනීමකින් තොරව බාහිර පුද්ගලයන් වෙත නිකුත් කර තිබුණි. | වෘත්තීය වැඩමුළු වලදී හා පුහුණු ක්ෂේත්‍රයේ ඉංග්‍රීසි ප්‍රවර්ධනය සඳහා පැවැත් වූ වැඩමුළු සඳහා එවකට සිට සභාපතිතුමාගේ වාචික උපදෙස් මත මෙම පොත් නොමිලේ නිකුත් කර ඇත . මෙවැනි තත්වයන් ඉදිරියේදී වලක්වා ගැනීම සඳහා අදාළ සියළුම පියවර ගෙන ඇත. | අලෙවි කිරීම සඳහා මුද්‍රණය කර තිබුණු පොත් නොමිලයේ බෙදාහැරීම සම්බන්ධයෙන් අනුමැතියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාචික උපදෙස් මත බාහිර පුද්ගලයන් වෙත පොත් නිකුත් කිරීමෙන් ආයතනයට සිදු වූ අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරුනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වෘත්තීය පුහුණුව හදාරන ආධුනිකයන්ට ලබාදීම සඳහා භාණ්ඩාගාර අරමුදල් යටතේ පෞද්ගලික ආයතනයක් වෙතින් මුද්‍රණය කර පුස්තකාලය වෙත 2016 වර්ෂයේදී ලබාදී තිබූ වටිනාකම රු. 1,300,645 ක් වූ වර්ග 15 කට අයත් පොත් 7,354 ක් නිකුත් කිරීමකින් තොරව පුස්තකාලයේ රඳවාගෙන තිබුණි. | වර්ග 5කට අයත් වටිනාකම රු. 744, 800 ක් වූ පොත් 6800 ක් වූ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සඳහා ඉංග්‍රීසි භාෂා පොත් වේ. නමුත් ඉංග්‍රීසි භාෂාව සඳහා NVQ ලබා නොදීමට ගත් ප්‍රතිපත්තිමය තීරණ නිසා මෙම ඉංග්‍රීසි පොත් වලට ඇති ඉල්ලුම අඩුවිය.<br>වටිනාකම රු. 554,845 ක් වූ වර්ග 10 කට අයත් අනෙකුත් පොත් 554 අදාල පාර්ශවකරුවන් අතර බෙදා හැර ඇත. පරිශීලනය සඳහා සැලකිය යුතු පිටපත් ප්‍රමාණයක් පුස්තකාලයේ තබා ඇත. | ආයතනයට සිදු වූ පාඩුව අවම කර ගැනීමට හැකි වන පරිදි විධිමත් අනුමැතියක් සහිතව පොත් බෙදාහැරීම් සිදු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2017 වර්ෂයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදි හදුනානොගත් වියදම් ලෙස දක්වා තිබුණු රු. 3,192,829 ක් ගිවිසුම්ගත සේවා යටතේ ඉකුත් වර්ෂයේ ලාභයෙන් කපා හැරීමේ වරද 2018 වර්ෂයේදී නිවැරදි කර නොතිබුණි. | 2017 වර්ෂයේදී ගිවිසුම් ගත ශේෂ යටතේ ගිණුම්ගතව තිබූ Transfer for Adjustment ගිණුම නිවැරදි කිරීම අදාල සටහන් යෙදීම පිණිස පරීක්‍ෂා කරමින් පවතී. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කල යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**--------------------------------**

**පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වනු ලබන ක්ෂේත්‍ර 28 ක් හඳුනාගෙන තිබුණද කොමිෂන් සභාව යටතේ පවත්නා නිපුණතා සභා 04 මඟින් ක්ෂේත්‍ර 15 ක් ආවරණය නොවන බව නිරීක්‍ෂණය විය. | ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් නිපුණතා ආංශික සභා 10 ක් පිහිටුවීමට ආරම්භයේදී සැලසුම් කර තිබුණද පසුව ආංශික නිපුණතා සභා 4 ක් සඳහා ප්‍රතිපාදන වෙන්ව තිබුණි. | හඳුනාගෙන තිබූ වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පාඨමාලා සංවර්ධනය කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) ලෝක කම්කරු සංවිධානය විසින් ව්‍යාපෘතියක් වෙනුවෙන් 2015 වර්ෂයේ දී ලබාදී තිබූ රු.3,103,402 ක මුදල අදාල කාර්යය වෙනුවෙන් වැය කර නොතිබූ අතර වසර 03 කට අධික කාලයක සිට ගෙවිය යුතු ශේෂ වශයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. අදාල කාර්යය ඉටු නොකිරීම හේතුවෙන් ඉතිරි වූ මුදල් ආපසු යැවීමට හෝ ආදායමට ගැලපීමට කටයුතු කිරීම වෙනුවට පාලක මණ්ඩලයේ හෝ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය කර තිබුණි. | මෙම ස්ථාවර තැන්පතු 03 හි අගය 2019 අගෝස්තු 21 දින පැවති කොමිෂන් සභාව මඟින් අනුමැතිය ලබා ගෙන සේවක ණය ගිණුමට මාරු කරන ලදී. | ප්‍රදාන අදාල අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් යෙදවිය යුතු අතර සේවක ණය ගිණුමට මාරු කිරීම වැරදි සහගත වේ. |
| (ඇ) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 2 වන වගන්තිය අනුව ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතාවලට සරිලන අයුරින් සියලුම මට්ටම්වල තෘතියික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම කොමිෂන් සභාවේ පොදු පරමාර්ථයක් විය. | කොමිෂන් සභාව ආංශික පුහුණු සැලසුම් 18 ක් පළාත් පුහුණු සැලසුම් 08 කට අදාළව වෘත්තීය පුහුණු සැලසුම් සාදා ඇත . මේ සම්බන්ධයෙන් පාඨමාලා ප්‍රතිතනය හා පුහුණු සැලසුම අනුව යටිතල පහසුකම් සඳහා මූල්‍යාධාර පහසුකම් සැපයීම පසු විපරම් කටයුතු සඳහා අදාළ වේ. | පිළිතුර විගණන නිරීක්‍ෂණයට අදාල නොවේ. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණ, සියළුම මට්ටම්වල තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම |

| | | |
|---|---|---|
| ඒ අනුව කොමිෂන් සභාව විසින් පුහුණු සැලසුම් (VET Plan) සකස් කර අදාල වෘත්තීය පුහුණු ආයතන වෙත ලබාදී තිබුණද ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර නොතිබුණි. | | සම්බන්ධීකරණය හා සංවර්ධනයේ නියමුවා ලෙස කටයුතු කිරිමය. එබැවින් කොමිෂන් සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් ලෙස අධීක්ෂණයක් සිදු කල යුතුය. |
| (ඇ)1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 15 (1) හා 16 (1) වගන්ති අනුව කිසිදු තැනැත්තෙකු හෝ අයතනයක් විසින් තෘතියික අධ්‍යාපන පාඨමාලාවන් හෝ වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන් මෙම පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබ නොපැවැත්විය යුතුය.<br><br>ඒ අනුව කොමිෂන් සභාවේ ලියාපදිංචි නොකර රට තුල ක්‍රියාත්මක කරනු ලබන තෘතියික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ආයතන හඳුනාගැනිමට හා ඒවා යාවත්කාලීන කරමින් තොරතුරු පද්ධතියක් පවත්වා ගැනිමට කොමිෂන් සභා විසින් කටයුතු කර නොතිබුණි. | ලියාපදිංචි කර ඇති පුහුණු මධ්‍යස්ථානය පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් මෙම කොමිෂන් සභාව මගින් පවත්වා ගෙන යනු ලබන අතර එය www.tvec.gov.lk යන වෙබ් අඩවියෙහි වන Information on Registered Training Centres ලෙස මහජනතාවගේ දැන ගැනීම සඳහා තොරතුරු ප්‍රදර්ශනය කර ඇත. එහි මේ දක්වා ලියාපදිංචි කර ඇති ආයතන 2709 ක තොරතුරු ඇතුලත් වේ.<br><br>2018 ජුනි 31 දින වන විට ලියාපදිංචිය වලංගුව පැවති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව 807කි.<br><br>TVEC ලියාපදිංචිය නොලබා පවත්වා ගෙන යනු ලබන පුහුණු ආයතන සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට යෝජනාකර ඇත. | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ අදාල වගන්ති පරිදි TVEC අයතනයේ ලියාපදිංචි නොකර රට තුල ක්‍රියාත්මක කරනු ලබන තෘතියිය හා වෘත්තීය අධ්‍යාපන ආයතන හදුනා ගැනීමට ක්‍රමවේදයක් හඳුනාගත යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2008 වර්ෂයේදී රු.2,150,000 කට මිලදී ගෙන තිබුණු මරුටි වර්ගයේ මෝටර් කාර් රථය 2017 සැප්තැම්බර් 18 දිනවන විට ධාවන කටයුතු වලින් ඉවත් කර නිෂ්ක්‍රීයව පැවතුණි. | KF-7354 අංක දරන මරුටි වර්ගයේ මෝටර් රථයේ අමතර කොටස් හිඟතාවය හා මිළ අධික තත්ත්වය මත අපහරණය කටයුතු සඳහා සූදානම් කර ඇත . | අදාල වාහනය දිරාපත්වීමට පෙර අපහරණය කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) කොමිෂන් සභාව විසින් ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව රේඛීය අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලේ රු.11,057,124 ක් වැයකර ඉදිකිරීම් හා සවිකිරීම් සිදුකර තිබීම හේතුවෙන් අටවන මහලෙහි වර්ග අඩි 943 ක කාමරයක් හැර ඉතිරි ප්‍රමාණය කිසිදු මුදලක් ගෙවීමකින් තොරව රේඛීය අමාත්‍යාංශය විසින් ආපසු ලබාගෙන භාවිතයට ගෙන තිබුණු බව 2019 මැයි 13 සිදුකළ ක්ෂේත්‍ර පරීක්‍ෂාවේදී නිරීක්‍ෂණය විය. ඒ අනුව දරන ලද වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | මෙම ගොඩනැගිල්ලේ රාජකාරී කිරීම අවදානම් බව නිළධාරීන් දිගින් දිගටම පැවසීම නිසා 2018 ඔක්තෝම්බර් 31 දිනැති මධ්‍යම ඉංජිනේරු කාර්යය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් ලබාගත් වර්තාව අනුවද 8 වන මහලේ රාජකාරී කිරීමට සුදුසු තත්වයක නොපවතින බවත් එම අටවන මහළ නැවත ප්‍රතිස්ථාපනය කළ යුතු බවත් සඳහන් කර ඇත . අපහට 06 වන මහළින් කාර්යාල පරිශ්‍රයක් ලබාදෙන ලදී. | ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර එහි ප්‍රතිඵලදායක බව සොයා බැලීමකින් තොරව සිදු කිරීම හේතුවෙන් ආයතනයට මෙම පාඩුව සිදුවී තිබුණි. ඉදිරියේදි එවැනි තීරණ ගැනීමේදී සැලකිලිමත්ව ක්‍රියා කල යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිපුණතා ආංශික සංවර්ධන අරමුදල් භාවිතා කරමින් අටවන මහලේ කාමර වෙන් කිරීම හා කාපට් ඇතිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2017 ඔක්තෝබර් 17 දින තාක්‍ෂණික ඇගයීම් කමිටුව විසින් සුදුසුකම් ලැබූ ලංසු කරුවෙකු නිර්දේශකර තිබුණි. එහෙත් කිසිදු හේතු දැක්වීමකින් තොරව එම ලංසුව අවලංගු කර නැවත ලංසු කැඳවා වෙනත් ලංසුකරුවෙකු තෝරාගැනීම හේතුවෙන් පළමු ලංසු කැඳවීමට අනුව සුදුසුකම් ලැබූ ලංසු කරුගේ මිල සමඟ සැසඳීමේදී එම කොන්ත්‍රාත්තුව ඉටු කර ගැනීම වෙනුවෙන් රු.1,075,629 ක් වැඩියෙන් වැය කිරීමට සිදු වී තිබුණි. | අටවන මහලේ කාමර වෙන්කිරීමේදී හා කාපට් ඇතිරීමේදී පළමු ටෙන්ඩර් කැඳවීමේදී කල්හාර බිල්ඩර්ස් ආයතනය පමණක් ඉදිරිපත් වී ඇත. ඔවුන් විසින් ඉදිරිපත් කර තිබූ ටෙන්ඩරයේ සිවිලිමේ වර්ග අඩියකට ඉංජිනේරු ඇස්තමේන්තුව රු. 197 ක් වුවත් අදාළ ආයතනය රු. 3,200 ක් ලෙස දක්වා තිබුණි.<br><br>ඒ අනුව තවත් ටෙන්ඩර් කැඳවන ලදී.<br><br>එහිදී ඉදිරිපත් වූ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාගෙන් අඩුම ඇස්තමේන්තුවට මෙම කොන්ත්‍රාත්තුව ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිසි ලෙස අනුගමනය ල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රෙල්ඛයේ 6.51 ඡේදය ප්‍රකාරව ගණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලතදී මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කලමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව 2019 ජුලි 11 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදි. | පිලිතුරු ලබා දී නැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විධිමත්ව ඉදිරිපත් කල යුතුය. |

**4.2 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 – 2018 කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාව විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය පරිදි වසර තුනකට අඩු නොවන කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර එය පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |

**4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාවේ 2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම හා එහි ඉලක්කයන් ළඟා කරගැනීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණු පහතින් දැක්වේ. | | |

| | | |
|---|---|---|
| (අ) රාජ්‍ය, පුද්ගලික හා රාජ්‍ය නොවන පුහුණු අයතනයන්හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා පාඨමාලා ප්‍රතීතනය සඳහා අවශ්‍ය පුහුණු උපකරණ ලබාදීම වෙනුවෙන් රු. මිලියන 2.4 ක් වෙන්කර තිබූ අතර ඉන් රු. මිලියන 1.44 ක් පමණක් පුහුණු උපකරණ ලබාදීම වෙනුවෙන් පෞද්ගලික ආයතන වෙත ගෙවීම් කර තිබුණි. | 2018 මූල්‍යාධාර ලබාදීමට පෞද්ගලික ආයතන පමණක් යොදා ගැනීමට කොමිෂන් සභාව තීරණය කර ඇති බැවින් ඒ සඳහා අයදුම්පත් කැඳවන ලදී. | මූල්‍ය ආධාර ලබාදීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ දෙකෙන්ම තෝරා ගැනීම සිදු කල යුතුය. |
| (ආ) 2018 වර්ෂයේදී කර්මාන්ත ක්ෂේත්‍ර 05 ක පාඨමාලා 09 ක් සඳහා මූල්‍යාධාර ලබාදීමේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි සියයට 43 ක් මූල්‍යාධාර අනුමත කරමින් ප්‍රමුඛතාවය එම ක්ෂේත්‍රයට ලබාදීමට කටයුතු කර තිබූ අතර අනෙකුත් ක්ෂේත්‍ර 04 සඳහා සියයට 07 සිට සියයට 21 ක පරාසයක මූල්‍යාධාර ලබා දී තිබුණි. | මූල්‍යාධාර ලබාදීමේදී නිර්ණායක සම්පූර්ණ කිරීම සහ අනෙකුත් නෛතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම බොහොමයක් අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලද ආයතන වලින් සිදු නොවන බැවින් ආයතන තෝරා ගැනීම ඉතා අපහසු කාර්යයක් වී ඇත. | විගණන නිරීක්ෂණයට අදාලව පිළිතුරු ලබාදී නොතිබූ අතර මූල්‍යාධාර ලබා දීමේදී පාලක මණ්ඩල අනුමැතින් ලබාගෙන ඒවා නිසි ක්‍රමවේදයක් තුල බෙදා හැරීම සිදුකල යුතුය. |
| (ඇ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතන වල පාඨමාලා 21 සඳහා මූල්‍යාධාර නිසි පරිදි භාවිතාකර ඇත්දැයි විමර්ශනය කිරීම කොමිෂන් සභාවේ කාර්යයක් විය. ඒ අනුව 2018 වර්ෂය තුලදී, 2015, 2016 හා 2017 වර්ෂයන් හිදී මූල්‍යාධාර ලබාදී ඇති පාඨමාලා 21 ක් විමර්ශනය කිරීමට සැලසුම් කර තිබුණද ඉන් පාඨමාලා 07 ක් පමණක් විමර්ශනය කර තිබුණි. | 2018 මූල්‍යාධාර ලබාදීමට පෞද්ගලික ආයතන පමණක් යොදා ගැනීමට කොමිෂන් සභාව තීරණය කර ඇති බැවින් අයදුම් පත්‍ර පෞද්ගලික පුහුණු ආයතන සඳහා පමණක් කැඳවීමෙන් පසු සුදුසු නිර්ණායක සම්පූර්ණ කරන ලද ආයතනවලට පමණක් ලබා දීමට කටයුතු කොට ඇත. | විගණන නිරීක්ෂණයට අදාලව පිළිතුරු ලබාදී නොතිබූ අතර මූල්‍යාධාර ලබාදීමෙන් පසු ඒවා නිසි පරිදි උපයෝජනය කර ඇත්දැයි විමර්ශනය කිරීම සිදුකල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සකස්කර ඇති ජාතික නිපුණතා සම්මත 40 ක් සමාලෝචිත වර්ෂයේදී සිංහල හා දෙමළ භාෂා වලට පරිවර්තනය කිරීමට සැලසුම් කර තිබුණද සම්මත 27 ක් හා විෂය මාලා 36 ක් සැලසුම් කල පරිදි ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2018 වර්ෂයේ නිපුණතා සම්මත සහ විෂයමාලා බලලත් කරනු ලැබුයේ අගෝස්තු මාසයේදී වන අතර භාෂාවලට පරිවර්තනය සඳහා ලබා දෙන ලැබුයේ ඔක්තෝබර් මාසයේදී නිසා එම ජාතික නිපුණතා සම්මත පරිවර්තනය කර 2018 වසරේදි ලබා ගැනීමට නොහැකි විය. | සැලසුම් පරිදි අවශ්‍ය ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවධානය යොමු කල යුතුය. |
| (ඉ)2018 වර්ෂයේදී ඇගයීම්කරුවන් 100 දෙනෙකු වෙත බලපත්‍ර ලබාදීමට සැලසුම් කර තිබුණි. ලිඛිත විභාගය සඳහා අයදුම්කරුවන් 320 ක් වෙත අයදුම්පත්‍ර යවා තිබූ අතර 136 දෙනෙකු පමණක් විභාගයට සහභාගිවී තිබූ නමුත් 2018 වර්ෂයේදී එකදු බලපත්‍රයක් හෝ ලබා දී නොතිබුණි. | ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මේ වර්ෂයේ දෙසැම්බර් මාසයට පෙර සුදුසු ඇගයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |

**4.4 අභ්‍යන්තර විගණනය**

------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂය තුල අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව ක්ෂේත්‍ර 13 ක විගණන කටයුතු සිදු කිරීමට සැලසුම් කර තිබුණද ඉන් ක්ෂේත්‍ර 09 ක විගණන කටයුතු සිදු කර නොතිබුණි. ඒ අනුව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නැත. | ඉදිරියේදී අනුමත විගණන සැලැස්ම අනුව කටයුතු කල යුතුය. |

**4.5 විගණන කමිටුව**

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2005 ජුලි 1 දිනැති අංක PED/31 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි සමාලෝචිත වර්ෂයේදී විගණන කමිටු දෙකක් පවත්වා නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි විගණන කමිටු පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. |

**4.6** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ගත ආදායම් වියදම් තත්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 2,567 දක්වා විචලනයන් සිදුවී තිබූ අවස්ථා 21 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නැත. | වාර්ෂික අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කර ගත යුතුය. |

**4.7** තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එන්සීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය පරිදි තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය’’ ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කලයුතුව පවතී. සමාලෝචිත වර්ෂයට අදාලව කොමිෂන් සභාව විසින් තම විෂය පථයට අදාල කාර්යයන් පිලිබඳ කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් තම කාර්යන් සම්බන්ධව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක ලඟා කර ගැනීම සඳහා ඒවා මැන බැලිම සඳහා වන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක ලඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය. |